විෂයය - සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය - 10

වාරය - 02

ඒකකය - එතෙපුල් අමා හැල්ලෙන්

ඉගෙනුම් පල

- පොතපත කියවීමේ දී ශෛලීය විවිධතා හඳුනා ගෙන කියවයි.
- අසන්නාට ප්‍රිය උපදවන පරිදි පැරණි සාහිත්‍ය නිර්මාණ කියවයි.
- නිවැරදි ශබ්ද උච්චාරණය කෙරෙහි අවධානය යොමු කරමින් හඬ නගා කියවයි.
- අන් අයගේ අවධානය දිනා ගනිමින් පොතපත කියවයි.

## ක්‍රියාකාරකම i

1. පහත සඳහන් වගුව නිවැරදි තොරතුරු සපයමින් සම්පූර්ණ කරන්න.

| ග්‍රන්ථය | කතුවරයා | යුගය | පරිච්ඡේදය | මුල් කර ගත් බුදු ගුණය |
|---|---|---|---|---|
| | | පොලොන්නරුව | | |
| | | | දහසය වන පරිච්ඡේදය | |
| | | | | අරහං |

2. පහත සඳහන් අර්ථ කියැවෙන පද පාඩමේ දී තිබෙන උද්ධෘත කොටස්වලින් උපුටා ලියන්න.

1. ඉවසීම ---------------------------------
2. දිවි හැර ---------------------------------
3. තුන් වරක් ---------------------------------
4. සෘද්ධි බලයෙන් -------------------------------
5. වළක්වා --------------------------------
6. ස්ත්‍රියක් ---------------------------------
7. කළ දහසයක් ----------------------------
8. වෙහෙසට පත් කරවා ----------------------
9. අවබෝධයෙන් යුක්තව ---------------------
10. හොඬවැල පහළට දමා -------------------
11. ආකාරයෙන් -------------------------
12. උගුලට හසු වූ -----------------------------
13. කන වැටෙත් ම --------------------
14. කරකැවී --------------------------------

15. පටු මඟකට -------------------------

16. හෙණ්ඩුවෙන් -----------------------------

17. ශරීරය -------------------------

18. ලජ්ජා භය ---------------------------------

19. වලිගය -------------------------

20 පය අසල --------------------------------

3. පහත සඳහන් පාඨයන්හි අන්තර්ගත උපමාලංකාරයන්හි උපමානය හා උපමේය වෙන් කොට ලියන්න.

i. ''මේ ඇත් චණ්ඩ යැ, පරුෂ යැ, මිනීමරු යැ, යුගත් ගිනි වැන්න.''
ii. ''මහ පොළොව තෙමෙ මැ කුඹල් සකක් සෙ පෙරළා පස්සෙහි ලාපී යැ.''
iii. ''කෝපයෙන් රත්ව ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජය.''
iv. ''මහ බිජුවකට මහ මෙර පෙරළන්නා සේ.''
v. ''ඇසූ ඇසූ සත්ත්වයන් මී බී මත් වූවන් සේ.''
vi. ''ඇසැ හුණු බුදු රැවින් කෙශර සිංහයක්හු දුටු ඇත් පොව්වකු සෙ.''
vii. '' යුගාන්ත වාතයෙන් නැමී යන අඳුන් කුළක් සෙ බුදුන් පාමුල්හි වැඳැ''
viii. බුද්ධ පූජාවට මල් දමක් දැමුවා සේ පුතු බුදුන් හා ඇතු මැදට දමා''
ix. ''ආකාශයෙහි පිපී වැනී ගිය තරු කැලයක් සේ පිරිවරා සිටිනා රහත් පෙළකින්''
x. ''සඳරස් දුටු කුමුදු කැලයක් සේ සියලඟ සන්තෝෂයෙන් පිනවමින්
xi. ''හිරිඔතප් ලද නියාවට කාරණ පැවා සේ වාලධිය අමුඩු හස්සෙහි ගන්වා ගෙන
xii. ''නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදුරජාණො යැ''

| උපමානය | උපමේය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

| | |
|---|---|
| | |
| | |

4. පාඩමේ උද්ධෘත කොටස්වලින් සොයා රූපක තුනක් ලියන්න.

| | |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

5 පහත සඳහන් උද්ධෘත පාඨයන්හි අර්ථය ලිහිල් බසින් ලියන්න.

i. ''එකල්හි බුද්හු ඉදුහ බලයෙන් ඔවුන් පිළිබහා සඟුන් අතුරෙහි සිටුවූහ.''
ii. ''ගිරාවැ ආ ස්වමීනට දහසක් කිරිය හැල් කෙතින් පිදූ සනායෙන්''
iii. ''ඇසැ හුණු බුදු රුවින් කෙශර සිංහයක්හු දුටු ඇත් පොව්වකු සෙ අනෙකක් සිතියැ නොහී''
iv. '' එකෙණෙහි ස්වාමිදරුවෝ මිණිරුවනකට තුඩ දිගු කරන නාරජකු සේ කුමරහු කරා අත දිගු කරන ඇත් රජු දැක''
v. ''දෙතිස් අසූ ලකුණෙන් හා සිසාරා සිටි බැම මඬුල්ලෙකින්''

## ක්‍රියාකාරකම ii

1. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද ඇතුළත් වරණය තෝරන්න.

1.

i. නිගණ්ඨ, වර්ණ, කෘශ්ණ, ප්‍රහීණ
ii. කළ, දළ, මළ, වදාල
iii. ඉනි, තැලි, මරනවා, තෘණ
iv. දූෂන, කෙකිනි, දුනු, ශිෂ්ට

2.

i. ප්‍රෞඪ, කනිෂ්ඨ, මර්ධනය, ස්පන්දනය
ii. නිදර්ශන, ප්‍රශ්න, විස්මය, ෂෝඩශ
iii. ලේඛණ, සම්ප්‍රදාන, ආස්වාද, කොට්ඨාශ
iv. සමස්ත, ප්‍රතිඵල, සජ්ඣායනා, දෘෂ්ඨි

3.

I. රතුඑැණු, මාංශ, අෂ්ඨ, ඥානය

II. දියලුණු, ප්‍රදානය, ප්‍රශස්ත, ගනඳුර
III. ප්‍රධාන, අත්‍යවශ්‍ය, බ්‍රාහ්මණ, නුගුන
IV. ආශ්වාද, කථිකාවත, ලමයා, දර්ශණ

4.

i. ගොවිපොළ, වෙළෙඳපල, තොටුපළ, තිප්පල
ii. ළැව් ගිනි, ළැදියාව, ළපටි, ලිහිණියා
iii. අභිනිෂ්ක්‍රමණ, අභිප්‍රේරණ, අභිමුඛ, අභිලාෂය
iv. ප්‍රත්‍යක්ෂ, ප්‍රවනතා, ප්‍රශංසනීය, ප්‍රයත්නය

5.

i. පර්යේෂණය, විශ්මය, විමර්ශන, දෘෂ්ටි
ii. අදෘශ්‍යමාන, අළුයම, සිත්කලු, නිරූපණ
iii. කනගාටු, පරිගණක, ප්‍රදර්ශනය, දක්ෂිණ
iv. කඳුලු, ප්‍රචණ්ඩ, මධ්‍යසාර, සමස්ත

2. පහත සඳහන් වාක්‍යවල අක්ෂර වින්‍යාසය සදොස් පද නිදොස් කොට ලියන්න.

i. ඔහු අලුත් මගක් ඔස්සේ යමින් සිංහල භාශාව පෝසනය කල ලේකකයකි.
ii. එතුමා විවිධ දුස්කරතා මදයයේ අධ්‍යාපනය ලැබ එයින් විඡුල පල නෙලා ගත් විද්වතෙකි.
iii. වර්ථමාන සමාජය දැනුවත් කිරීම සඳහා බෙදා හැරෙන අත් පත්‍රිකා බෙහෙවින් ආකර්ශණීය වෙයි.
iv. අලුත් සහල් මංගල්‍යය ගොවියා කෙත ඇසුරෙන් ලැබූ සික්ශණය මණාව කියා පාන්නකි.

3. අක්ෂර වින්‍යාසය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

i. ''භවත් නාලාගිරිය තා සොළොස් කළක් රා පොවා මත් කරන්නාහු අනෙකක්හු ගන්නට නොවෙති.''
ii. ''සර්වඥයින් වහන්සේ තුන් විටෙක්හි ඇළව යා යි වදාල සේක.''
iii. ''එකෙනෙහි කුමාර අනික් ශරණක් නොදැක බුදුන් දිශාව බල බලා මහ හඬින් හඬන්නට වන.''
iv. බුදුන්ගේ අනුභාවයෙන් පොලව කුඹල් සකක් සේ පෙරළී උන් වහන්සේ පසු කොට බුදුන් වහන්සේ පළමු කළේ ය.''

4. පහත සඳහන් වචනවල හිස්තැනට ගැළපෙන අකුරු වරහනින් තෝරා වචන සම්පූර්ණ කරන්න.

i. අක්ෂරෝච් ---රණය (ඡා/චා)
ii. අග්ග ------(ලා/ළා)
iii. අධීක්----ණය (ෂ/ශ)
iv. මුකු -----වැන්න(ණු/නු)
v. ප---තුරු(ල/ළ)
vi. ප----චාත්තාපය(ස්/ශ්)
vii. පරි---ණක(ස/ග)
viii. ශු---ශ්‍රීර්වාදය(භා/බා)

ix. උද්ඝෝෂ---ය(න/ණ)
x. අභිනි----ක්‍රමණය (ෂ්/ස්)

5. අක්ෂර වින්‍යාසය නිවැරදි පදය තෝරන්න.

i. කෘමිනාශක/කෘමිනාෂක
ii. කොට්ඨාශය/කොට්ඨාසය
iii. ගනාන්ධකාරය/ඝනාන්ධකාරය
iv. ජීවානුකරණය/ජීවාණුහරණය
v. නෂ්ටාවශිෂ්ට/නෂ්ටාවෂිශ්ට
vi. පිළිවෙළ/පිළිවෙල
vii. පෙළපාලිය/පෙළපාළිය
viii. භස්මාවශේෂ/භෂ්මාවශේෂ
ix. වලාකුළ/වළාකුල
x. ශීඝ්‍රගාමී/සීග්‍රගාමී

## ක්‍රියාකාරකම iii

1. පහත පදවල යෙදී ඇති 'න, ණ' අනුව අර්ථය වෙනස් වෙයි. එම අරුත ඉස්මතු වන සේ වාක්‍ය නිර්මාණය කරන්න.

i. පහන/පහණ
ii. වන/වණ
iii. වෙන/වෙණ
iv. සරන/සරණ
v. කිරන/කිරණ

2. පහත දැක්වෙන පදවල නිවැරදි අර්ථය ඉදිරියෙන් ලියන්න.

| | | |
|---|---|---|
| i. | වල ----------------- | වළ ------------------- |
| ii. | මුලු ---------------- | මුළු ------------------- |
| iii. | කුල ------------ | කුළ ------------------ |
| iv. | පැල---------------- | පැළ ------------------ |
| v. | බල ---------------- | බළ -------------------- |
| vi. | පල----------------- | පළ -------------------- |
| vii. | කල ----------- | කළ ------------------- |
| viii. | හල ----------- | හළ -------------------- |
| ix. | සුලු --------------- | සුළු -------------------- |
| x. | ඇල ------------- | ඇළ -------------------- |

3. සුදුසු පරිදි විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

i. සී ඩබ් ඩබ් කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනයේ පියා ය
ii. ශ්‍රී ලංකාවේ මුල් ම රාජධානි ත්‍රිත්වය අනුරාධපුරය පොලොන්නරුව දඹදෙණිය

iii. පලතුරු අනුභව කරන්න නැතහොත් ඔබට රෝදුකින් පෙළෙන්නට වේ.

iv. භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය ග්‍රන්ථයේ 146 159 පිටු බලන්න.

v. මම ගෙදර යමි ඇ කීවා ය.

vi. හේන්වලට එන කුරුල්ලන් පැන්නීම මෙහි හැඳින්වෙන්නේ සකලයෝ අඹනවා යනුවෙනි.

vii. මේ මද නැඟී ඇතු කිහිඹියක ගහටා මරාපී මුත්  සිතා වදාරා තමන් වහන්සේගේ කරුණා නමැති අකුස්සෙන් පැහැර ඇතු රඳවාලා.

viii. කොවුලා ගී ගයන්නේ ඇයි

ix. තේ හැඳි එක දෙක බැගින් කෑමට පෙර පසු බොන්න.

x. අවුරුදු ලක්ෂ ගණනක් පුරා අපගේ පාෂාණීභූත ඉන්ධන ගල් අඟුරු, තෙල් සහ භූමි වායුව සෑදුණි.

## පිළිතුරු

### ක්‍රියාකාරකම i

1. අමාවතුර, ගුරුළුගොමින්, දාහතර වන පරිච්ඡේදය, පුරිසධම්ම සාරථි

   බුත්සරණ, විද්‍යාචක්‍රවර්තී, පොලොන්නරුව, නව අරහාදී බුදුගුණ සියල්ල

   පූජාවලිය, මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමි, දඹදෙණිය, විසිනව වෙනි පරිච්ඡේදය

2. 1. අධිවාසනා 2 දිවි පියා 3 තුන් යළක් 4 ඉදුහ බලයෙන් 5 පිළිබඹා 6 මාගමක් 7 සොළොස් කළක් 8 කළකුරුවා 9 පිළිලද සංවේග 10 අත බඟා 11 සනායෙන් 12 මලෙහි බැඳුණු 13 කනැ හෙත්ම 14 සිසැරී 15 කෝවේයකට 16 අකුස්සෙන් 17 සියලඟ 18 හිරිඔතප් 19 වාලධිය 20පාමුල්හි

3.

| උපමානය | උපමේය |
|---|---|
| යුගත් ගින්න | හස්තියා |
| කුඹල් සකක් කරකැවීම | මහ පොළොව කරකැවීම |
| රත් යවට | ඇස් |
| මහමෙර මහ බිජුවකට පෙරළීම | ඇතා කෙරෙහි ම සමස්ත කරුණාව යොමු කිරීම |
| මී බී මත් වූවන් | ශ්‍රවණය කළ සත්ත්වයන් |
| කේශර සිංහයකු දුටු ඇත් පොව්වා | නාලාගිරි හස්තියා |
| යුගත් වාතයෙන් ඉදිරී වැටුණු අඳුන් කුළ | බුදුන් පාමුල වැඳ වැටුණු ඇත් රජ |
| බුද්ධ පූජාවට මල්දමක් දැමීම | බුදුන් හා ඇතා අතරට දරුවා දැමීම |
| අහසෙහි පිපී වැනී ගිය තරු කැලය | පිරිවරා ගත් රහතන් වහන්සේලා |
| සඳරැස් දුටු කුමුදු කැලය | සියලඟ සතුටින් ඉපිල යෑම |
| වලිගය දෙකකුළ අතර ගසා ගැනීම | ලජ්ජා භය උපන් බව ඇඟ වීමට කාරණා දැක්වීම |
| නිල් මහනෙල් මල් | ඇස් |

4. රූ අමා, පෙම්වතුරු, කෝගිනි

5.

   i. එකල බුදුරදුන් ඍද්ධි බලයෙන් ඔවුන් පිටුපසට කොට සංඝයා අතර රැඳ වූහ
   ii. ගිරා ආත්මයෙහි ඉපිද සිටි බෝසතුන්ට කිරිය දහසක ප්‍රමාණයේ ඇල් වී වපුරා තිබූ කුඹුරකින් පිදූ ආකාරයෙන්
   iii. බුදුරුව ඇස ගැටුණු විට කේශර සිංහයකු දුටු ඇත් පැටවකු මෙන් වෙනත් දෙයක් සිතා ගැනීමට නොහැකි ව
   iv. එකල්හි බුදුරජාණන් වහන්සේ මැණිකකට දිව දික්කරන නාගරාජයකු මෙන් කුමාරයා වෙත හොඬය දිගු කරන හස්තිරාජයා දැක
   v. තිස් දෙකක් හා අසූවක් වූ ලක්ෂණයන්ගෙන් ද වටේට විහිදෙන රැස් වළල්ලකින්

### ක්‍රියාකාරකම ii

1. 1- iii 2-ii 3- iii 4- iii 5- iii

2.

i. භාෂාව, පොෂණය, කළ, ලේඛකයකි
ii. දුෂ්කරතා, මධ්‍යයේ, විපුල , ඵල
iii. වර්තමාන, ආකර්ෂණීය
iv. ශික්ෂණය, මනාව

3. - i

4. i. චා ii- ළා iii- ෂ iv- ණු v- ල vi- ශ් vii-ග viii- භා ix- ණ x-ඡ්

5.

i. කෘමිනාශක
ii. කොට්ඨාසය
iii. ඝනාන්ධකාරය
iv. ජීවාණුහරණය
v. නෂ්ටාවශිෂ්ට
vi. පිළිවෙළ
vii. පෙළපාළිය
viii. භස්මාවශේෂ
ix. වලාකුළ
x. ශීඝ්‍රගාමී

## ක්‍රියාකාරකම iii

1.

i. ප්‍රදීපය/පාෂාණය
ii. වනාන්තරය/ තුවාලය
iii. වෙනත්/වීණාව
iv. සංචාරය/පිහිට
v. (බඩු)කිරීම/රශ්මිය

2.

i. කැලෑව - ආවාටය
ii. මුල්ල - සමූහය
iii. කුලය - මුදුන/කූටය
iv. පැල්පත - පැළෑටිය/අංකුරය
v. ශක්තිය - භට
vi. ඵලය -ප්‍රකට
vii. කාලය -කරන ලද
viii. ශාලාව - අත්හරින ලද
ix. ස්වභාවය - කුඩා
x. පැත්ත - (දිය) අගළ

3.

i. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා නිදහස් අධ්‍යාපනයේ පියා ය.

ii. ශ්‍රී ලංකාවේ මුල් ම රාජධානි ත්‍රිත්වයඃ අනුරාධපුරය, පොලොන්නරුව, දඹදෙණිය.

iii. පලතුරු අනුභව කරන්න; නැතහොත් ඔබට රෝදුකින් පෙළෙන්නට වේ.

iv. භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය ග්‍රන්ථයේ 146 - 159 පිටු බලන්න.

v. ''මම ගෙදර යමි'' ඈ කීවා ය.

vi. හේන්වලට එන කුරුල්ලන් පැන්නීම මෙහි හැඳින්වෙන්නේ 'සකලයො අඹනවා' යනුවෙනි.

vii. මේ මද නැඟි ඇතු කිහිඹියක ගහටා මරාපී මුත්..... සිතා වදාරා තමන් වහන්සේගේ කරුණා නමැති අකුස්සෙන් පැහැර ඇතු රඳවාලා.

viii. කොවුලා ගී ගයන්නේ ඇයි?

ix. තේ හැඳි එක /දෙක බැගින් කෑමට පෙර /පසු බොන්න.

x. අවුරුදු ලක්ෂ ගණනක් පුරා අපගේ පාෂාණීභූත ඉන්ධන (ගල් අඟුරු, තෙල් සහ භූමි වායුව) සෑදුණි.